**නැණ සයුර II පත්‍රය - පිළිතුරු**

**ඉන්දීය ඉතිහාසය**

**A කොටස**

1. ලංකා සිතියමේ ස්ථාන 12 ක් ලකුණු කොට නම් කිරීම.

(ලකුණු 12 යි)

**B කොටස**

2.

* ඉන්දීය ඉතිහාසය ගොඩ නැංවීමෙහිලා එහි භූගෝලීය පිහිටීම ප්‍රබල ලෙස බලපෑම.
* උතුරින් හා ඊසාන දෙසින් හිමාලය මහා කඳු පන්තිය නිසා ඉන්දියාව ආසියාවේ වෙන් කරයි තවද ටිබෙට් සානුවෙන් ද වෙන් කරයි.
* වයඹ දෙසින් හින්දුකුෂ්, සුලෙයිමාන්, කිර්තාර් කඳු පන්තිය නිසා බාහිර ලෝකයෙන් ඉන්දියාව වෙන් කරයි.
* නැගෙනහිරින් පත්තොයි, ඇරකන්යෝමා, නාගලන්ත කඳුවැටි නිසා බුරුමයෙන් වෙන් කරයි.
* හිමාල කඳු වැටිය සංක්‍රමණ හා ආක්‍රමන සම්බන්ධයෙන් ආරක්ෂකයෙකුව සිටීම.
* කුෂාණයන් හිමාලය පසුකර චීනය දක්වාම පාලනය ගෙනයාම.
* ඉන්දියාවේ බෞද්ධ සංස්කෘතිය හිමාලයෙන් එපිට පවා ව්‍යාප්ත වීම.
* ජන සංක්‍රමණ හා විදේශීය ආක්‍රමණ වලින් ඉන්දියානු ඉතිහාසය ප්‍රබල වෙනස්කම් වලට භාජනය වීම සඳහා හින්දු කුෂ් කඳුවැටිය බලපෑම.
* එයින් ගලා හැලෙන ගංගා වයඹදිග ඉන්දියාවට පෝෂණය කිරීම.
* ඉන්දියාවේ ඇති දුර්ගමාර්ග ඉතිහාසයට ප්‍රබල බලපෑම් එල්ල කිරීම.ඛයිබර් දුර්ගය වැදගත්වීම.එය ඉන්දියාවේ රන් දොරටුවයි.
* කාන්ථාර වල බලපෑම ප්‍රබලව බලපෑම (අදාළ විස්තර ඇත්නම් ලකුණු පිරිනමන්න.)

(ලකුණු 16 යි)

3. (i) මව් දෙවඟන (ජගත් මාතා) වන්දනය
හිරුසඳු වන්දනය
ගිනිදෙවි වන්දනය
ජල වන්දනය
වෘක්ෂ වන්දනය
ත්‍රිමූර්තිය

(ලකුණු 02 යි)

(ii) නලඟනරුව, කවන්ධ මිනිස් රුව, මොල්ලිය සහිත ගව රූපය, පූජක රුව

(ලකුණු 02 යි)

(iii) ලෝතාල් වරාය, සුක්ත ජෙන්ඩෝර්වරාය

(ලකුණු 02 යි)

(iv) * ලොව දියුණුතම නාගරික ශිෂ්ටාචාරය වේ.
* දියුණු නාගරික ලක්ෂණ රැසක් හමුවීම.
උදා:- මාර්ග පද්ධතිය / කාණු පද්ධතිය / මහල් නිවාස / ආලෝක ලාම්පු / ධාන්‍යාගාරය
* දියුණු ආර්ථිකයක් පැවතීම.
* විදේශ වෙළදාම
* වෙළඳ නගර
* වෙනත් ශිෂ්ටාචාරයන් සමඟ සබඳතා පැවතීම.

(විස්තර කිරීම සහිතව ලකුණු 10 යි)

4. * අශෝක අභිෂේකයෙන් 8 වන වසරේ කාලිංගය දිනීම.
* ඉන් ඇති සිත් තැවුල නිසා දිග්විජය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තියට අවතීර්ණවීම.
* රට වැසියාගේ යහපතට අශෝක ධර්මය ඉදිරිපත් කිරීම.
* අශෝකගේ 6 වන ගිරි ලිපියෙහි අඩංගු කරුණු
"මුලු ලොවට හිත වැඩ ..."
* ධෞලිගිරි ලිපිය "සියලු මිනිසුන් මගේ දරුවෝ"
* ධර්මමහා මාත්‍ර නිලධාරීන් පත් කිරීම.
* රට වැසියාගේ අධ්‍යාත්මය සුවපත් කිරීම.
* වාරිමාර්ග තැනවීම, රෝහල් ඉදි කිරීම, යාචකයන්ට දන් දීම.
* දෙවන ශිලා ලිපියෙහි අඩංගු කරුණු

(විස්තර කර තිබීම ලකුණු 16 යි)

5. (i) රාජාණ්ඩු
* රාජාණ්ඩු පාලනය ක්‍රි.පූ.6 වන සියවසේ උතුරු ඉන්දියාවේ ප්‍රබල රාජ්‍යයන් 04 ක ක්‍රියාත්මක වීම.
* මගධ. කෝසල, වත්ස්‍ය, අවන්ති ඊට නිදසුන් ය. (රාජ්‍ය 04 හඳුන්වන්න.)
* මේ රාජාණ්ඩු පාලනයක ප්‍රධානියා රජුවීම.
* රාජාණ්ඩු පාලනයක රජුවටා බලය කේන්ද්‍රගත වීම. (ආදී විස්තරය)

(ii) හිමාල කඳුවැටිය
* වයඹදිග ඉන්දියාවේ ආරක්ෂකයා ලෙස හඳුන්වයි.
* ඉන්දියාව ඉරානය, ටිබෙටය ආදියෙන් වෙන් කරනු ලබන්නේ හිමාල කඳුවැටියයි.මේ කඳුවැටියෙන් ගංගා සමූහයක් ඇද හැලෙමින් සමස්ථ ඉන්දියාවම පෝෂණය කරයි.
* කඳු වැටියෙන් තැනින් තැන දුර්ග මාර්ග කිහිපයක් ද පිහිටා ඇත.

(ආදී විස්තරය)

(iii) මෞර්යය යුගයේ කලාව හා ගෘහ නිර්මාණ
* මෞර්යය අධිරාජ්‍යය විශාල භූමි ප්‍රදේශයක ව්‍යාප්තව පැවති නිසා එහි සංස්කෘතික බලපෑම ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවලද දක්නට ලැබීම.
* මෙකල මහා පරිමාණයේ කලා කෘති බිහිව ඇත.
* පාටලී පුත්‍ර නගරයේ නටඹුන්, බෝධි මණ්ඩලය, අශෝක ස්තම්භ. සත්ව රූප, ස්ථූප ඊට නිදසුන් වේ.
* චන්ද්‍රගුප්ත රජුගේ මාළිගාව ගැන මෙගස්තීන් ඉන්ඩිකා ග්‍රන්ථයේ සඳහන් කර ඇත.
* එහි ගල්කුලුණු 89 ක් දක්නට ලැබීම.
* අශෝක රජු විසින් කල ස්ථූප 84000 ක් ගැන ලාංකීය වංශ කතාවල සඳහන් වීම,ඒ අතර සාංචි, භාර්හුත් වැනි ආගමික සිද්ධස්ථාන ඉතා වැදගත් වීම.
* අශෝක රජුගේ තනිගලින් නෙලන ලද අශෝක ස්තම්භය විශිෂ්ඨ කලා නිර්මාණයකි.මෙවැනි ස්ථම්භ 30 ක් පමණ හඳුනාගෙන ඇත.ඒවාහි අලංකාර මූර්ති, රූප කැටයම් කර තිබීම.

(ආදී විස්තරය)

(iv) සංගම් සාහිත්‍යය
* සංගම් යන්නෙහි අරුත රැස්වීම යන්නයි.
* මෙය ක්‍රි.ව.1 ශතවර්ෂයේ සිට ක්‍රි.ව. 3 වන සියවස අතර කාලයට අයත්ය.
* මේ රැස්වීමේදී රචිත සාහිත්‍යය සංගම් සාහිත්‍යය ලෙස හැඳින්වේ.
* මෙය දකුණු මදුරාවේදී ප්‍රථම සංගමය ද දෙවැන්න කබෘඩපුරම් වල ද තුන්වැන්න මධුරාවේ ද පවත්වා ඇත.මේ සංගම්වලට සහභාගි වූ උගතුන් තම නිර්මාණ එහිදී ඉදිරිපත් කර ඇත.දැනට මෙම ග්‍රන්ථ දැකගත නොහැකි අතර දෙමළ සාහිත්‍යයේ පැරණි ව්‍යාකරණ ග්‍රන්ථය ලෙස තොල්කාප්පියර් විසින් රචිත තෝල් කාප්පියම් දැනට ඉතිරිව ඇති එකම ග්‍රන්ථයයි.
* තෙවන සංගමයේ ඉදිරිපත් වූ අරුල් කෘතිය උසස්ම ග්‍රන්ථයකි.
* මෙය තිරුවල්ලු වාර් නම් කවියා විසින් රචනා කරන ලදී.එහි ආචාර ධර්ම, ධනය, ආලය, වැනි විවිධ විෂයන් අලලා ලියන ලදී.

(ආදී විස්තරය)

(එක් කොටසකට 8 බැගින් 8X2 = 16)

**C කොටස**

6.

* පශ්චාත් මෞර්යය අවධියේ ශුංගවරුන් යටතේ සංස්කෘතික දියුණුවක් විය.
  භාර්හුත්, සාංචි, බුද්ධගයා ආදී ස්ථාන මොවුන් ප්‍රතිසංස්කරණය කිරීම.
* ඉන්දු - ග්‍රීකයන් යටතේ මිලින්ද රජු ග්‍රන්ථ රචනා කිරීම.
* උසස් අන්දමේ කාසි මෙකල නිකුත් කරන ලදි.
* කුෂාණ යුගයේ සංස්කෘතික දියුණුවේ ඉහළම අවස්ථාව වෙන්වීම.
* කනිෂ්ක සමයේ සිව්වන ධර්ම සංගායනාව පැවැත්වීම, බුද්ධ ප්‍රතිමා නෙලීම, ගාන්ධාර, මථුරා කලා සම්ප්‍රදායන් බිහිවීම මෙකල කැපී පෙනේ.
* විවිධ ග්‍රන්ථ සිව්වන ධර්ම සංගායනාවෙන් පසු රචනා කිරීම.
* ගත් කතුවරුන් රැසක් බිහිවීම ආදිය ඉතා වැදගත් වීම.

(ලකුණු 16 යි)

7. (i) සමුද්‍රගුප්ත

දෙවන චන්ද්‍රගුප්ත

පළමු කුමාර ගුප්ත

මහාරාජ ශ්‍රී ගුප්ත

ඝටොත්කජ ගුප්ත

මහාරාජ ශ්‍රී චන්ද්‍රගුප්ත (ලකුණු 02යි )

(ii) කවිරාජ, සටන් සියයක වීරයා (ලකුණු 02 යි)

(iii) පිෂ්ඨපුරය , දේවරාෂ්ට්‍රය

එරන්ද පල්ලය , කුස්ථලපුරයේ

වෙංගිය , කෞරාලයේ

අවමුක්තය

පලක්කය

කොට්ටුරයේ (ලකුණු 02 යි)

(iv) * පළමුවන චන්ද්‍රගුප්ත රජුගේ හා ලිච්ඡවී කුමාර දේවියගේ පුතු සමුද්‍රගුප්තයන් ය.

* හරිසේන රාජසභා කවියාගේ අලහාබාද් ප්‍රශස්තියෙන් මේ රජු පිළිබඳ පැහැදිලි විස්තරයක් හඳුනාගත හැක.

* මේ රජුගේ දේශපාලන සේවාවන් දෙස බැලීමේ දී

✓ ආර්යාවර්තය යටත් කිරීම.

✓ අටවික රාජ්‍යය යටත් කිරීම.

✓ දක්ෂිණාපථය ආක්‍රමණය කිරීම

✓ දේශසීමා රාජ්‍ය සටන් කිරීම.

* මේ රජු නිකුත්කල කාසි වලින් රජුගේ බල ව්‍යාප්තිය පැහැදිලිව හඳුනාගත හැකිවීම.

(විස්තර කිරීම සහිතව ලකුණු 10 යි)

8. (i) * ථානේෂ්වරයේ පුෂ්‍යභූති රාජ් වංශයේ හර්ෂ වර්ධන රජු ඉතා වැදගත් පාලකයෙකි.

* මේ රජුගේ දේශපාලනික සේවාවන් ගත්කල

✓ වලභියේ මෛත්‍රිකයන්ට එරෙහිව සටන් කරයි.

✓ චාලුක්‍යාන්ට එරෙහිව සටන් කරයි.

✓ නැගෙනහිර රාජ්‍යයන් සමඟ සටන් කරයි. (එක් මාතෘකා විස්තර කිරීම වැදගත්)

(ii) හර්ෂවර්ධන රජුගේ සංස්කෘතික සේවාවන්

* ශීලාදිත්‍ය ලෙස හැඳින්වීම.

* කනෞජයේ මහා ආගමික සම්මේලනයක් පැවැත්වීම.

* නාලන්දා විශ්ව විද්‍යාලයට මේ රජු ප්‍රබල අනුග්‍රහයක් ලබාදීම.(ආගමික සම්මේලනය විස්තර කර තිබිය යුතුය. )

(ලකුණු 16යි )

9.

(i) තෛප්‍රාක්ෂික බල අරගලය

* හර්ෂවර්ධනගෙන් පසු කනෞජයේ බලය ලබා ගැනීමට ප්‍රධාන රාජ්‍යයන් තුනක් අතර වූ ගැටුම තෛප්‍රාක්ෂික බල අරගලය ලෙස හැඳින්වේ.
* එනම් ගුර්ජරවරුන්
  පාලවරුන්
  රාෂ්ට්‍රකූටයෝ ය.
* ප්‍රථමයෙන් කනෞජයේ බලය ලබා ගැනීමට ගුර්ජරවරුන් හා පාලවරුන් ගැටේ.
* එහිදී වත්සරාජ, ධර්මපාල වැනි අය වැදගත් වේ.
* පසුව රාෂ්ට්‍රකූටයෝ හා පාලවරුන් අතර ගැටුම නිර්මාණය වීම.

(ප්‍රමාණවත් ලෙස විස්තර කර තිබීම)

(ii)

* පශ්චාත් ගුප්ත යුගයේ පරිපාලනය මැනවින් සිදුව ඇත.
* පරිපාලනයේ ප්‍රධානියා රජුවීම.
* රජුට අධිරාජ්‍ය පාලනය පහසු කරවීමට එය කොටස්වලට බෙදා දැක්වීම.
  මධ්‍ය පාලනය
  ප්‍රාදේශීය පාලනය
* පාලනයේ පහසුවට සභාව නමින් ආයතනයක් පිහිට වීම.
* පාලනය කොටස්වලට බෙදා දැක්වීම. භුක්ති / මණ්ඩල / විෂය / ග්‍රාම

(ආදී විස්තර)

(iii)

* පල්ලවයන් දකුනු ඉන්දීය රාජ්‍යයකි.
* අගනුවර කාංචියයි.
* මෙහි ප්‍රථම පාලකයා බප්පදේවයි
* පසුව ශිව ස්කන්ධවර්මන්
  විෂ්ණු ගෝප
  සිංහ විෂ්ණු
  පළමුවන මහේන්ද්‍රවර්මන් යන විශිෂ්ඨ පාලකයෝ මෙහි රාජ්‍යත්වය ගෙන ගොස් ඇත.

(ඒ ඒ පාලන කාලය විස්තර කර තිබීම ප්‍රමාණවත්)


(iv) චෝළ සංස්කෘතිය

ආගම - හින්දු ආගමේ වර්ධනය
දේවාල ඉදිවීම.
ශිව හා විෂ්ණු වන්දනය ජනප්‍රිය වීම
බෞද්ධ, ජෛන ආගම් දැඩි තර්ජන වලට ලක්වීම.

භාෂාව - කණ්ණඩ, දෙමාල, තෙලිගු මෙකල ප්‍රධාන භාෂා ලෙස භාවිතාවීම.
සංකරාචාර්ය, වෙන්කත මාධව, කම්බන් වැනි සංස්කෘතික උගතුන් මෙකල බිහිව ඇත.
විශිෂ්ඨ ග්‍රන්ථ රැසක් රචනා කරන ලදී.

ගෘහ නිර්මාණ - ගෘහ නිර්මාණ ගඩොල් හා ගල් වලින් ඉදි කිරීම.
දේවස්ථාන ඉදි කිරීම
රාජරාජේශ්වර දේවාලය, බෘහදීශ්වර දේවාලය, තිරුවාලීශ්වර දේවාලය
චිත්‍ර කලාව දියුණු වීම.
මූර්ති කලාව දියුණු වීම.(නටරාජ මූර්තිය)

තිරුවාලීශ්වර දේවාලය(ආදී විස්තර) (ලකුණු 8 x 2 = 16 යි)



සිතියම් අංකය 01
N
නූතන දේශසීමා
Modern Boundary